**ශීර්ෂය - 145 - බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය**

**----------------------------------------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනයකළ මතය

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂ සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම**

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| (අ) උක්ත චක්‍රලේඛයේ 7 (II) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ආදායම් එකතු කරනු ලබන වෙනත් අමාත්‍යාංශ එම ආදායම් තම මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ භාණ්ඩාගාරයෙන් ලද අක් මුදල් ලෙස සලකා ඒසීඒ - 3 ආකෘතියේ ඇතුලත් කල යුතු වුවත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එසේ එකතු කර තිබූ රු.5,688,182 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ බදු නොවන ආදායම් හා වෙනත් ආදායම් ලැබීම් යටතේ ඒසීඒ - 1 ආකෘතියේ දක්වා තිබුණි. | 267/2018 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් පිළියෙල කල යුතුවේ. | ඒසීඒ - 1 ආකෘති පත්‍රය අනුව රු.5,688,182 යන වටිනාකමින් රු.1,708,943 ක් මුදලින් ලබා ගෙන ඇත. හරස් සටහන් මගින් ඉතිරි මුදල වන රු.3,979,239 ක් ලබා ගෙන ඇත.<br><br>මුදලින් ලද රු.1,708,943 ක මුදල ඒසීඒ - 3 ආකෘති පත්‍රයේ අනිකුත් මූලාශ්‍ර මාතෘකාව යටතේ පෙන්නුම් කර තිබෙන රු.96,514,079 ක වටිනාකම තුළ අන්තර්ගතව ඇත. |
| (ආ) චක්‍රලේඛයේ 7(vi) ඡේදය අනුව අනෙකුත් ප්‍රධාන ලෙජර් යටතේ දරන ලද වියදම් ලෙස අත්තිකාරම් “බී” ගිණුමට අදාළව රු.2,589,769 ක් සැසඳුම් ගිණුමට හර කල යුතුවිය. එසේම මුදල් රෙගුලාසි 208 යටතේ වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වැය විෂයයන් වෙනුවෙන් දරන ලද වියදම් ලෙස රු.5,121,162,903 ක් හා අනෙකුත් ප්‍රධාන ලෙජර් යටතේ දරන ලද වියදම් ලෙස අත්තිකාරම් “බී” ගිණුමට අදාළව රු.61,980 ක් සැසඳුම් ගිණුමට බැර කල යුතුවිය. එහෙත් එම අගයන් නිවැරදිව හර හා බැර කරමින් අග්‍රිම සැසඳුම් ගිණුම පිළියෙල කර නොතිබුණි. | - එම - | අග්‍රිම ගිණුම සහ ගෙවිය යුතු අග්‍රිම ගිණුම් යන ගිණුම් දෙවර්ගයම අප විසින් පිළියෙල කරණු ලබයි. එහිදී අප විසින් අනුගමනය කරනු ලබන පද්ධතිය මගින් එම අරමුණ ඉටුවන නමුදු මේ සඳහා කිසිදු අනුමත ආකෘතියක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 267/2018 මගින් ඉදිරිපත් කර නැත. |
| (ඇ) පුනරාවර්තන වැය විෂයයන් 37 ක් අතර මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ මාරු කර තිබූ රු.10,513,000 ක ප්‍රතිපාදන හා වැය විෂයයන් 02 අතර මාරු කර තිබූ රු.20,000,000 ක ප්‍රතිපාදන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව හඳුන්වා දී තිබූ ඒසීඒ - 2 ආකෘතියෙහි ඇතුලත් කර නොතිබුණි. | - එම - | 2018 අයවැය ඇස්තමේන්තු යටතේ වෙන් කර තිබූ ප්‍රතිපාදන අවසන් වීම හේතුවෙන් වැඩසටහන් 1 හි ප්‍රනරාවර්ථන වැය විෂයයන් 13 ක් සඳහා එම වැඩසටහනෙහි වෙනත් වැය විෂයයන් 24 කින් රු.10,513,000 ක ප්‍රතිපාදන මු.රෙ.66 හා 69 යටතේ මාරු කිරීමට කටයුතු |

| | | |
|---|---|---|
| | | යොදන ලදී. මෙහි දී මු.රෙ. ප්‍රකාරව එකම වැඩසටහනකට අයත් වැය විෂයයන් 37 ක් අතර ප්‍රතිපාදන අඩු කිරීම හා එකතු කිරීම සිදු කර ඇති බැවින් එම අගයන් එම වැඩසටහන තුළදීම තුලනය වේ. |
| (ඇ) උක්ත චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ දී එම වත්කම්වල ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම කේවල වත්කම් වටිනාකම් සමඟ පරීක්ෂා කර බලා එම වටිනාකම් සැසඳෙන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් තහවුරු කර නොතිබුණි. | - එම - | එකඟ වෙමි. මින් ඉදිරියට මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ දී එම වත්කම්වල ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම කේවල වත්කම් වටිනාකම් සමඟ පරීක්ෂා කර බලා සැසඳෙන බවට තහවුරු කර ඉදිරිපත් කරන බව දන්වමි. |

**1.6.2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය විසින් මිලදී ගෙන තිබූ රු.23,098,945 ක් වූ මූල්‍ය නොවන වත්කම් හා රු.362,686,407 ක්වූ කෙරීගෙන යන වැඩ ඇතුළුව රු.644,035,255 ක් වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ විස්තර ඒසීඒ - 6 ආකෘතියේ ඇතුලත් කර නොතිබුණි. | 267/2018 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ උපදෙස් නිසි පරිදි අනුගමනය කල යුතුවේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි පරිගණක පද්ධතිය තුළ වැය විෂයයන් (2101, 2103, 2104, 2105) යටතේ වැය වන වියදම් පමණක් වත්කම් නිර්මාණය කෙරේ. එම නිසා 2202 වැය විෂයයට සිදු කෙරෙන වියදම් වත්කම් ලෙස හඳුනාගැනීමට නොහැකිය. |

**1.6.3. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂනය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නොමග ගිය සටන්කරුවන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුවන් පුහුණු | වියදම් වර්ගීකරණය නිවැරදිව සිදු කල යුතුවේ. | 2018 වර්ෂයට පෙර පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ |

| | | |
|---|---|---|
| කිරීම හා සංවර්ධනය කිරීම සඳහා සහ පශ්චාත් පුනරුත්ථාපන සහාය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් දරා තිබූ රු.9,409,455 ක පුනරාවර්තන වියදම් 145-1-2-5-2002 වැය විෂයය යටතේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | | සියලු වියදම් සඳහා මහා භාණ්ඩාගාරය විසින් මූලධන වියදම් යටතේ ප්‍රතිපාදන වෙන් කරන ලද අතර ඒ අනුව සියලු වියදම් මූලධන වියදම් යටතේ වැය දරන ලදී. |

**1.6.4. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | <u>නිරීක්ෂණය</u><br><u>අනුකූල නොවීම</u> | <u>නිර්දේශය</u> | <u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|---|
| <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | | | | |
| (අ) | මුදල් රෙගුලාසි 104(1)අ | හිටපු අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත අනුයුක්ත කරන ලදුව නැවත භාරගෙන තිබූ වාහනවලට සිදු වී තිබුණු හානි පිළිබඳ මූලික පරීක්ෂණයක් හෝ සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 පරිදි කටයුතු කල යුතුවේ. | රථ භාරගන්නා අවස්ථාවේ මෙම හානි සිදු වී තිබූ අතර එම මෝටර් රථයේ අලාභ අයකර ගැනීමට පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | මුදල් රෙගුලාසි 104(4) | අලාභ හානි සිදු වූ දින සිට මාස 03 ක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත් වාහන 05 කට අවස්ථා 06 කදී සිදු වූ අනතුරු පිළිබඳව පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | අනතුරු 04 ක් පිළිබඳව මු.රෙ.104 අනුව පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති අතර ඉතිරි අනතුරු සඳහා පරීක්ෂණ කටයුතු අවසන් වන තෙක් රියදුරුගේ හා භාරකරුගේ වැටුප් හා දීමනා රඳවා ගැනීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 237(ආ) | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් සිදු කිරීමට ප්‍රථම භාණ්ඩ ලැබී ඇති බවට ද අදාල බඩු ලේඛනයන් හි, තොග පොත් යනාදියෙහි එකී භාණ්ඩ ඇතුලත් කර ඇති බවට ද සහතිකයක් ඇමිණිය යුතු වුවත්, රු.443,118 ක් වටිනාකම ඇති භාණ්ඩ ඒකක 19 ක් සඳහා භාණ්ඩ ලැබීමට පෙර ගෙවීම් සිදු කර තිබුණි. | -එම- | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු සිදු නොවන ආකාරයට කටයුතු කරමි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 115 | 2017 වර්ෂයේ බැරකමක් ලෙස ගිණුම් ගත කර නොතිබූ බැරකමක් නිරවුල් කිරීම සඳහා එකී වැය විෂයයක අරමුණුවලට පටහැනිව රු.943,674 ක් ගෙවා තිබූ අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 115 අනුව අනුමැතිය ලබා ගෙන ද නොතිබුණි. | මුදල් රෙගුලාසි 115 අනුව අනුමැතිය ලබා ගත යුතු වේ. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂය ආරම්භයේ දී ඉල්ලුම් නොකිරීම හේතුවෙන් බැරකමක් ලෙස ගිණුම් ගත කර නොමැති අතර වැය විෂයය 145-01-02-2001 යටතේ කැප්පෙටිපොළ, මාවත අංක සී40, නිල නිවාසයේ වැසිකිළි වැඩි දියුණු කිරීම, මුළුතැන්ගෙය අවට හා අපද්‍රව්‍ය පිටවන නල මාර්ගය අළුත්වැඩියාව වෙනුවෙන් ගෙවීම් කර ඇත. ඉදිරියේ දී මෙවැනි ගෙවීම් සිදු කිරීමේ දී මු.රෙ.115 යටතේ අනුමැතිය ලබා ගෙන කටයුතු කරමි. |
| (ඉ) | මුදල් රෙගුලාසි 315(1),(2) හා 755 | හිටපු අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරයා හා මාධ්‍ය ලේකම් වෙත ලබා දී තිබුණු රු.702,869 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා හිටපු අමාත්‍යවරයා වෙත අමාත්‍යාංශය විසින් අනුයුක්ත කර තිබුණු රු.35,000,000 ක් වටිනා නිල රථයක් රාජකාරි අවසන් වීමෙන් පසු නැවත ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 315 හා 755 පරිදි කටයුතු කල යුතුවේ. | ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ගබඩාවට ආපසු ලබා දෙන ලෙස අවස්ථා ගණනාවකදීම ලිපි මගින් දන්වා ඇති අතර හිටපු අමාත්‍යතුමා වෙත අනුයුක්ත කර තිබූ මෝටර් රථය භාර දෙන ලෙස අවස්ථා 05 කදී දැනුම් දී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තැනැත්තන්, දේපළ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය සඳහා 145-01-02-04-1503 වැය විෂයය යටතේ වෙන් කර තිබූ රු.මිලියන 2,080 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 539.3 ක ප්‍රතිපාදන අක්මුදල් නොලැබීම මත ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කල යුතුවේ. | තැනැත්තන් දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියෙහි පුනරුත්ථාපන වියදම් යටතේ වෙන් කරන ලද රු.මිලියන 2,080 ක ප්‍රතිපාදනයෙන් වර්ෂ අවසාන වන විට රුපියල් මිලියන 539.3 ක ප්‍රතිපාදන ඉතිරිව ඇත. ඒ සඳහා හේතුව නිසි පරිදි අක් මුදල් නොලැබීමය. |
| (ආ) | වාර්ෂික ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා නොතිබූ මූලධන වැය විෂයයන් 05 ක් සඳහා සලසාගෙන තිබූ රු.මිලියන 3,381 ක පරිපූරක ප්‍රතිපාදනවලින් රු.මිලියන1,312.07 ක් ඉතිරිව පැවතුණි. ඉන් වැය විෂයයන් 03 ක ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 46 සිට සියයට 100 දක්වා වූ පරාසයක පැවතුණි. | - එම - | ඉදිරිපත් කළ නිතීරීති අනුව සටන්කාමීන් සමාජගත වීමට දැක්වූ අකමැත්ත, එම ආධාර වෘත්තීය හා ජීවනොපාය ආධාර ලෙස ක්‍රියාත්මක කිරීමට භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී නොතිබීම හා වර්ෂ අවසානයේ බිල්පත් ගෙවීමට නොහැකි වීම වැනි හේතු නිසා බිල්පත් නිරවුල් කිරීමට ඉල්ලා ඇති පරිපූරක ප්රතිපාදන ඉතිරි විය. |
| (ඇ) | උතුරු නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීමේ කටයුතු වේගවත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2017 වර්ෂයේ දී දරන ලද වියදම්වලට අදාලව දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඉදිරිපත් කර තිබූ රු.මිලියන 755.3 ක හිඟ බිල්පත් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය මුදල ඉක්මවා රු.මිලියන 781.1 ක පරිපූරක ප්‍රතිපාදන ලබා ගැනීම හේතුවෙන් රු.මිලියන 25.8 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. | - එම - | 2017 වර්ෂයේ රු.මිලියන 133.7 ක බිල්පත් නිරවුල් කිරීමට ලබා දී තිබූ පරිපූරක ප්‍රතිපාදනවලින් රු.මිලියන 107.9 ක් නිරවුල් වූ විට ඉතිරි මුදල වේ. |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක රු.මිලියන 1,200 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඉක්මවා රු.මිලියන 206.42 ක වියදම් දරා තිබීමෙන් හා මෙම වැය විෂයයන් සඳහා රු. මිලියන 114 ක පරිපූරක ප්‍රතිපාදන ලබා ගෙන තිබීමෙන් ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | - එම - | 2017 වර්ෂයේ දී ලබා දී තිබූ අක්මුදල් ප්‍රමාණවත් නොවීම නිසා රු.මිලියන 13.9 ක අතැති බිල්පත් පැවති අතර ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු විය. ඇස්තමේන්තු කිරීමේ දී අතැති බිල්පත් වටිනාකම ඊට ඇතුලත් කිරීමට නොහැකි නිසා ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමට සිදු විය. |

**2.2. අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිලධාරීන් දෙදෙනෙකුගේ සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.235,206 ක හිඟහිටි ණය ශේෂ සඳහා වර්ෂ 7 සිට වර්ෂ 8 දක්වා කාලපරාසයක් ගත වී තිබුණ ද අය වී නොතිබුණි. | ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුවේ. | ණය ශේෂ අයකර ගැනීම සඳහා ලිපි මඟින් දන්වා ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ අයවැය යෝජනාවකට අනුව නිෂ්පාදන සමුපකාර හරහා උතුරු පළාතේ තෝරාගත් කුඩා කර්මාන්ත සඳහා ආධාර කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වූ රු.මිලියන 1,000 ක ප්‍රතිපාදනවලින් | ප්‍රතිපාදන සලසා ඇති අරමුණට අනුව කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | භාණ්ඩාගාර අනුමැතිය මත දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ප්‍රතිපාදන නිදහස් කර ඇත. |

රු.මිලියන 125.57 ක ප්‍රතිපාදන නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක 03 ක් සඳහා විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත ලබා දී තිබුණි. එසේම තවත් රු.මිලියන 250 ක් තල් සංවර්ධන මණ්ඩලය සඳහා ලබා දී තිබුණි.

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ විශේෂ අයවැය යෝජනාවකට අනුව පෞද්ගලික අංශය විසින් රැකියා ලබා දීමට නියමිත පුනරුත්ථාපනය වූ නැවත සමාජගත කල හිටපු සටන්කාමීන් සඳහා වන වැටුප් සහනාධාර යෝජනාක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 250 ක පරිපූරක ප්‍රතිපාදන 2018 ජනවාරි 05 දින අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණද එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ඇති වී තිබූ ගැටළු හා මෙම ප්‍රතිපාදන වෙනත් ආකාරයකට වැය කිරීම සඳහා වන යෝජනා ඇතුලත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2018 නොවැම්බර් 02 දින ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. 2018 නොවැම්බර් 19 දිනැති මුදල් අමාත්‍යවරයාගේ නිර්දේශ අනුව සංදේශයේ ඇතුලත් යෝජනා මෙම වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින් මේ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන් පසු 2019 අයවැය යෝජනාවලට ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දී තිබුණි. | සැලසුම්ගත පරිදි ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුවේ. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ආදාල නීතිරීති මහා භාණ්ඩාගාරය විසින් නියම කරන ලදී. ඒ අනුව පුනරුත්ථාපනය කරන ලද නොමග ගිය සටන්කරුවන් ලෙස එම පුද්ගලයින් සමාජගත වීමට දැක්වූ අකමැත්ත නිසා එම ආධාර ජීවනෝපාය ආධාර ලෙස ඔවුන්ට ලබා දීමට අනුමැතිය භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කල ද ඒ සඳහා අනුමැතිය ලබා දී නොතිබුණි. එම නිසා උක්ත ව්‍යාපෘතිය යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි විය. |
| (ආ) | උතුරු හා උතුරුමැද පළාත්වල වෙසෙන ණය ගැති භාවයෙන් පෙළෙන ජනතාවට ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් | ප්‍රායෝගිකව හදුනාගන්නා ගැටලුවලට විසඳුම් ඇතුලත් නව යෝජනා | මෙම වැඩසටහන සඳහා ඒ වන විට අමාත්‍යාංශය සූදානම්ව නොසිටි අතර මෙම |

| | | |
|---|---|---|
| ලබාදීමේ වැඩසටහන සඳහා ලබාගෙන තිබූ රු.මිලියන 1,000 ක පරිපූරක ප්‍රතිපාදනවලින් රු.මිලියන 500 ක් උතුරු පළාතේ දිස්ත්‍රික්ක 05 කට ද ඉතිරි රු.මිලියන 500 ක ප්‍රතිපාදන උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා ද ලබා දී තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට මෙම ප්‍රතිපාදනවලින් සියයට 46 ක් එනම් රු.මිලියන 542.49 ක් වැය කර තිබූ අතර එහි භෞතික ප්‍රගතිය පිළිබඳ ඇගයීමක් අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි. මුදල් අමාත්‍යාංශයේ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම නිර්ණායකයන් හා මගපෙන්වීම් අනුව වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණ ද ණය පොලී අනුපාතිකය සියයට 14 ක් වැනි ඉහළ අගයක් ගෙන තිබීම හා සලකා බලනු ලබන ණය සීමාව වන රු.20,000 ට වඩා ජනතාවගේ ණයගැති භාවය ඉහළ මට්ටමක පැවතීම ඇතුලු ඇති වී තිබූ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් රු.මිලියන 457.5 ක පරිපූරක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. හඳුනාගත් ගැටළුවලට විසඳුම් ඇතුලත් නව යෝජනා ඉදිරිපත් කර වර්ෂය මුලදී ලැබී තිබූ ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ප්‍රශස්තව උපයෝජනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරිපත් කර වර්ෂය මුලදී ලැබී තිබූ ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ප්‍රශස්ථව උප යෝජණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුවේ. | කාලය තුලදී රාජ්‍ය ප්‍රතිපත්තිවල සිදු වූ වෙනස් වීම් නිසා පොලී නොමැතිව ප්‍රතිලාභී ජනතාවට ලබා ගත හැකි ලෙස මහ බැංකුවේ අධීක්ෂණය යටතේ වැඩසටහන් ගම්මානවලට යාම නිසා ජනතාව මෙම වැඩසටහන්වලට සහභාගි කර ගැනීමේ ගැටළු ඇති වී ඇත. එසේම මෙම ණය වැඩසටහනේ උපරිම ණය සීමාව රු.20,000 ක් හා පොලී අනුපාතිකය සියයට 14 ක් වීම ගැටළුවකි. සමස්ථයක් ලෙස නව හඳුන්වා දීමකි. පූර්ව අත්දැකීම් නොමැතිව ඉතා අසීරුතා මධ්‍යයේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. එහිදි බාධා හා අවහිරතා තිබූ නිසා මුළු මුදල වියදම් කිරීමට නොහැකි වී ඇතත් එය ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු සංවිධානය කිරීමට අපේක්ෂිතය. |

## 3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 110 හි විධිවිධානවල සඳහන් ආකෘතිය ප්‍රකාරව පවත්වන ලද හානි පිළිබඳ ලේඛනයක සිද්ධීන් 18 කට අදාල මුළු එකතුව රු.810,624 ක් වූ හානි පිළිබඳ විස්තර විධිමත් පරිදි වාර්තා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | පාඩු හා හානි ලේඛනය ඉදිරියේ දී විධිමත්ව සකස් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 වර්ෂයේ ජුලි - දෙසැම්බර් කාලපරිච්ඡේදය තුල දෙවරක් අනතුරට | -එම- | පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින අතර |

| | | |
|---|---|---|
| පත්ව තිබූ වාහනයක් ඇතුළුව වාහන අනතුරු 03 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ඒවායේ පාඩුව තක්සේරු කර ගිණුම් ගත කිරීමට නොහැකි වී තිබුණි. | | ඉදිරියේ දී තක්සේරු කිරීම සඳහා ඇස්තමේන්තු ලබා ගැනීමට කටයුතු කරමි. |

**4. යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ ක්‍රියාත්මක අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුලු කාර්යය මණ්ඩලය 06 ක් සේවයේ යොදවා තිබුණු නමුත් අනුමත කාර්යය මණ්ඩලය තීරණය කර නොතිබුණි. අමාත්‍යාංශයේ සංවර්ධන වැඩසටහන් යටතේ රු.මිලියන 3,663.41 ක් වූ විවිධ ව්‍යාපෘති පිළිබඳව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි. | ආයතනයේ සියලුම අංශ සඳහා අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුවේ. | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු මගහරවාගෙන කටයුතු කරන බව දන්වා සිටිමි. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කාර්ය මණ්ඩල පුරප්පාඩු 36 අතර සහකාර ලේකම් තනතුරු 02 ක්, ඉංජිනේරු තනතුරු 02ක්, සහකාර අධ්‍යක්ෂ තනතුරු 03 ක්, පරිපාලන නිලධාරී තනතුර හා භාෂා පරිවර්ථන තනතුරු 02 ක්, සංවර්ධන නිලධාරී 05 ක්, කළමනාකරණ සහකාර තනතුරු 06 ක්, රියදුරු 06 ක් ආදී ස පැවතුණි. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා අදාල ආයතන සමග සම්බන්ධ වී පුරප්පාඩු පිරවීම හෝ අතිරික්ත තනතුරු වේ නම් භාණ්ඩාගාරය සමහ සාකච්ඡා කර අවශ්‍ය පියවර ගැනීම. | මෙම පුරප්පාඩු පිරවීමට අදාලව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, ඉංජිනේරු සේවා මණ්ඩලය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කර තිබුණ ද ප්‍රතිඵල ලැබී නැත. එම පුරප්පාඩු හේතුවෙන් අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු ඵලදායීව පවත්වාගත නොහැකි වීම, උතුරු පළාතේ ක්‍රියාත්මක |

වන කඩිනම් සංවර්ධන හා නිවාස ව්‍යාපෘතිවල කටයුතු අධීක්ෂණය කිරීමට නොහැකි වීම, භාෂා පරිවර්ථන කටයුතු නිසි වේලාවට සිදු කර ගැනීමට නොහැකි වීම යනාදි බාධාවන් සිදුව ඇත.